සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**දෙවන වාර පරීක්ෂණය 2018** — **11 ශ්‍රේණිය**
**இரண்டாம் தவணைப் பரீட்சை 2018** — **தரம் 11**
**Second Term Test 2018** — **Grade 11**

***චිත්‍ර I***
***சித்திரம் I***
***Art I***

***පැය එකයි***
***One hour***
***1 மணித்தியாலம***

නම/විභාග අංකයඃ- ..........................................................................................................................................................

- සියළුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- පහත දැක්වෙන කලා කෘතිය හඳුනා ගෙන ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්න වලට අදාල පිලිතුරු තිත් ඉර මත ලියන්න



කොළඹ ජාතික කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති මෙය (01) ............................................................ ප්‍රතිමාවයි. පොළොන්නරු අංක 01 ශිව දේවාලයෙන් සොයාගෙන ඇති මෙය ක්‍රි.ව. (2) ................................ වෙනි සියවසට අයත්ය. (3) .............................................. මාධ්‍යයෙන් පූර්ණ උන්නතව මූර්තිමත් කර ඇති මෙයින් ශිව දෙවියන්ගේ (04) ................................................ විලාසයක් පෙන්නුම් කරයි. ප්‍රතිමාවේ වම්පස පාදය ඔසවා සිටින අතර , දකුණු පාදයෙන් සිටටි වාමන රුවෙන් (05) ........................................................ සංකේතවත් කරයි.

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා අදාල ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

(06) මහනුවර යුගයේ පහතරට බිතුසිතුවම් දැකගතහැකි ස්ථානයක් නම් කරන්න ...............................................................

(07) කොළඹ ජාතික කලාභවනේ නිත්‍ය ප්‍රදර්ශනයට තබා ඇති " ගඩලාදෙණිය " නම් දියසායම් චිත්‍රය නිර්මාණය කරන ලද චිත්‍ර ශිල්පියා නම් කරන්න. ..........................................................................................................................

(08) A. මාර්ක් නම් ශිල්පියා විසින් ඉවතලන ද්‍රව්‍ය උපයෝගී කරගනිමින් නිමකළ විස්තරාත්මක බවින් අඩු සරළ හැඩ සහිත මූර්තිය නම් කරන්න. ..........................................................................................................................

(09) මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් තීරු මත රූප චිත්‍රණය කිරීමේ දී නරඹන්නාට පහසුවෙන් තේරුම් ගැනීමට හැකිවන පරිදි ඇඳ තිබෙන ක්‍රමය කුමක් ද? ..........................................................................................................

(10) 14 වන ශතවර්ෂයේ දී රජකළ iii වන වික්‍රමබාහු රජ දවස දෙල්මඩ මූලාචාරීන් විසින් නිමකළ ගම්පොළ යුගයට අයත් දේවාලය කුමක්ද? ..........................................................................................................

- **ප්‍රශ්න 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) ශිව දෙවියන්ගේ මූලාදර්ශයක් නිරූපණය වෙතැයි පැවසෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් කලා නිර්මාණය කුමක් ද?

1. මොල්ලිය සහිත ගව රුව.
2. අං සහිත දෙවියා.(පශුපති)
3. කවන්ද රුව.
4. පූජක රුව.

(12) ශ්‍රී ලංකාවේ පුවත් පත් කාටූන් කලාවේ පුරෝගාමියා ලෙස සැලකෙන 43 කණ්ඩායමට අයත් ශිල්පියා නම් කරන්න.

1. ඩබ්ලිව්. ආර්. විජේසෝම
2. කැමිලස් පෙරේරා.
3. ඔබ්රි කොලට්.
4. ජෙෆ්රි යූනුස්.

(13) ප්‍රසිද්ධ ග්‍රීක මූර්තියක් වූ හර්මීස් සහ ඩයෝනීසියස් නම් මූර්තිය නිර්මාණය කරන ලද්දේ

1. මයිරන්. 2. ප්‍රැක්සිටෙලස් 3. පීඩියස්. 4. ඇන්ටිසෝව්.

(14) M. සර්ලිස් ශිල්පියා විසින් සිතුවම් ඇඳ අති බෞද්ධ විහාරස්ථානයක් නොවන්නේ කුමක්ද?

1. කොළඹ මාළිගාකන්ද විහාරය.
2. පොතුවියේ පූජාරාමය.
3. කැළණිය රජ මහා විහාරය.
4. ඉදුරුව යාලේගම විහාරය.

(15) ඊජිප්තු අමර්ණා යුගයේ දී නිර්මාණය කරන ලද කලා නිර්මාණය වන්නේ

1. මීඩම්හි පාත්තයෝ.
2. නෙපර්ටිටි.
3. ස්ක්‍රයිබ්.
4. ස්පින්ක්ස්.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍ය බැගින් ලියන්න.**

(16) අල්පනා :- ..........................................................................................................

(17) ෆ්‍රෙස්කෝ බුවනෝ :- ..........................................................................................................

(18) සන්නිදර්ශන චිත්‍ර :- ..........................................................................................................

(19) කාරයික්කාර් අම්මෙයියාර් :- ..........................................................................................................

(20) සාදිලිංගම් :- ..........................................................................................................

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා හිස්තැන් පුරවන්න.**

(21) "පාට්ටුත්තිරත්තාලේ " නම් ග්‍රන්තයේ පිටකවරය සරසවන ලද්දේ .......................................................... ශිල්පියා විසිනි.

(22) දෙගල්දොරුව රජ මහා විහාරය සිතුවම් නිර්මාණකරණ කාර්යයේ පුරෝගාමියා ලෙස කටයුතු කර ඇත්තේ .......................................................... ශිල්පියා ය.

(23) ඊජිප්තු සිතුවම් අතර හිස්තැන් පිරවීම සඳහා .................................................................. භාවිතා කර ඇත.

(24) ප්‍රංශයේ ලූවර් කෞතුකතාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇති වීනස්දි මේලෝ මූර්තිය ........................................ ශිල්පියා විසින් නිර්මාණය කරන ලද්දකි.

(25) සුදු අත් සහිත පූජක රූපය සහ ගණපති රූපය ................................................................ විසින් නිර්මාණය කරන ලද්දකි.

- **ප්‍රශ්න 26 සිට 30 තෙක් දී ඇති ප්‍රශ්නවලට A,B,C,D,E යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.**



**A**



**B**



**C**



**D**



**E**

(26) පොළොන්නරුව අංක 5 දරණ ශිවදේවාලයෙන් හමුවී ඇති දැනට පොළොන්නරු කෞතුකාගාරයේ ප්‍රදර්ශනය වන මෙම ප්‍රතිමාවේ නම කුමක්ද? ..........................................................................................................................

(27) මහනුවර යුගයේ පහතරට සම්ප්‍රදායෙන් ඇඳ ඇති සිදුහත් උපත නිරූපිත මෙම චිත්‍රය දැකගත හැකිවන්නේ කොහේද?

..........................................................................................................................................................

(28) උද්‍යාන මූර්තියක් ලෙස ලෝකඩ භාවිතයෙන් නිමකර ඇති මෙම මූර්ති කරනු ලැබූ ශිල්පියා කවුද?

.................................................................................................................................

(29) 20 වන සියවසේ ලපමැන් නමින් ඉතා ජනප්‍රිය මෙ කාටූන් චරිතය නිර්මාණය කළ ශිල්පියා නම් කරන්න.

..........................................................................................................................................................

(30) "කියවන ළමයා " නමින් කැන්වසය මත තෙල්සායමින් නිමකළ මෙම චිත්‍රය අඳිනු ලැබුවේ කවුරුන් විසින් ?..................................................................................................................................................

- **ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් දී ඇති වචන වලට නිවැරදි පිළිතුරු සපයන්න.**

(31) ස්වර්ගස්ත වූ කිතුනුවහන්සේ උකුලේ හොවාගෙන වැලපෙන මරිය මව්තුමිය දක්වෙන මයිකල් ආන්ජිලෝ විසින් නිර්මාණය කළ මූර්තිය නම්කරන්න. ..........................................................................................................

(32) ගම්පොල යුගයට අයත් ගඩලාදෙනි විහාරය හඳුන්වනු ලබන තවත් නමක් වන්නේ ....................................................

(33) මහනුවර දළදා මාළිගයේ පත්තිරුප්පුව නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද? ..................................................

(34) මැදවල විහාරය කුමන සණයට අයත් විහාරයක් ද? ..........................................................................................

(35) ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා විසින් නිමකළ මොනාලිසා සිතුවම කුමක් මත නිර්මාණය කරන ලද්දක් ද?
..............................................................

- **ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**



(36) ශිල්පියා :- ..........................................................................................

(37) තේමාව :- ..........................................................................................

(38) චිත්‍රය ඇති ස්ථානය :- ..........................................................................................

(39) කලා ලක්ෂණ :- ..........................................................................................

(40) ශිල්පීය කුසලතා :- ..........................................................................................